# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2473/07 - 2026 ජනවාරි මස 26 වැනි සඳුදා - 2026.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/LG/LND/2/අත්පත් කරගැනීම 344-380
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/7/2010/HW/225.

බදුල්ල - වෙන්කලාඩි මාර්ගය සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 94 G සුමුදුගම ග්‍රාම නිලධාරි වසමේ, මාපාඇල්ල ගමේ පිහිටි, අවසාන ගම් පිඹුරු අංක 535, අතිරේක අංක 7හි පත්‍ර අංක 7හි කැබලි අංක 289, 292, 293 සහ 294හි දැක්වෙන ඉඩමේ මායිම් පහත පරිදි වේ.

**01.** කැබලි අංක 289

ඉඩමේ නම: ෂෝලන්ඩ්වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත (අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත.); හිමිකම් කියන අය: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව - බදුල්ල වෙන්කලාඩි මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්. 0.0138.

*උතුරට*: කැබලි අංක 250, 277 සහ 290; *නැගෙනහිරට*: කැබලි අංක 290; *දකුණට*: කැබලි අංක 24, 285 සහ 287; *බස්නාහිරට*: කැබලි අංක 285, 287 සහ 250

**02. කැබලි අංක 292**

ඉඩමේ නම: නැත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත (අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත.); හිමිකම් කියන අය: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව - බදුල්ල වෙන්කලාඩි මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්. 0.0005.

*උතුරට*: කැබලි අංක 291, 72 සහ 293; *නැගෙනහිරට*: කැබලි අංක 293; *දකුණට*: කැබලි අංක 293 සහ 290; *බස්නාහිරට*: කැබලි අංක 290 සහ 291

**03. කැබලි අංක 293**

ඉඩමේ නම: බොල්ලෙත්තේවෙල වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත (අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත.); හිමිකම් කියන අය: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව - ඉඩම් අත්කර ගැනීම පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී; මුල් හිමිකම්පාන්නා සෙනවිතිස්සපුර, ලුණුගල හි පදිංචි විමලරත්න ලියනවික්‍රමසිංහ, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා ප්‍රමාණය: හෙක්. 0.0031.

*උතුරට*: කැබලි අංක 72; *නැගෙනහිරට*: කැබලි අංක 72 සහ 294; *දකුණට*: කැබලි අංක 294, 290 සහ 292; *බස්නාහිරට*: කැබලි අංක 290 , 292, 291 සහ 72

**04. කැබලි අංක 294**

ඉඩමේ නම: බොල්ලෙත්තේවෙල වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත (අවුරුදු 5-10ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත.); හිමිකම් කියන අය: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව - ඉඩම් අත්කර ගැනීම පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී; මුල් හිමිකම්පාන්නා: සෙනවිතිස්සපුර විහාරය, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා ප්‍රමාණය: හෙක්. 0.0031.

*උතුරට*: කැබලි අංක 293 සහ 72; *නැගෙනහිරට*: කැබලි අංක 72 සහ අ.ග.පි. 536 (කොට්ටල්බැද්ද මැදගංගොඩ); *දකුණට*: අ.ග.පි. 536 (කොට්ටල්බැද්ද මැදගංගොඩ) සහ කැබලි අංක 290; *බස්නාහිරට*: කැබලි අංක 290 සහ 293

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.03.23 දින පෙ. ව. 09.30 ට ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.02.28 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. පුවනේන්ද්‍රන්,**
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2026 ජනවාරි මස 21 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0262

**ශුද්ධි පත්‍රය**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : GCF/ATH/KL/03/LA.
*කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග*
*අමාත්‍යාංශයේ අංකය* : 03J/91/LRB/108.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තිය යටතේ අංක 995/26 හා 1997.10.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීම පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

*ඉඩමේ විස්තරය* :

කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලපලුවාව ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක : 7293 දරන මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති ඉඩම් කැබලි දෙකෙහි මුළු ප්‍රමාණය හෙක්ටයාර් 0.4899 යන්න වෙනුවට 0.4898 ක් ලෙස නිවැරදි විය යුතුය.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මහකොළඹ ගංවතුර පාලනය කිරීමේ හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
කොලොන්නාව.

2026 ජනවාරි මස 19 වැනි දින,
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය

EOG 01 - 0263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.